# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2333/15 - 2023 මැයි මස 22 වැනි සඳුදා - 2023.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1928 අංක 31 දරන උද්භිද උද්‍යාන ආඥාපනත

1973 අංක 32 දරන පනතින් සංශෝධිත 1928 අංක 31 දරන උද්භිද උද්‍යාන ආඥාපනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සංචාරක හා ඉඩම් කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

**හරීන් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023ක් වූ මැයි මස 15 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

01. මේ නියෝග 2023 උද්භිද උද්‍යාන (ඇතුලුවීමේ ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර වර්ෂ 2023 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

02. යම් උද්භිද උද්‍යානයකට තැනැත්තන් ඇතුලුවීමේ දී අය කරනු ලැබිය යුතු ගාස්තුවල අනුප්‍රමාණ, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

එසේ වුවද, පහත දක්වෙන තැනැත්තන්, එසේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවනු ලැබීමෙන් නිදහස් වන්නේ ය ;

(අ) ශ්‍රී ලංකා ජනරජයේ අමුත්තන්,
(ආ) උද්භිද උද්‍යාන තුළ පිහිටි නිවාසවල පදිංචිකරුවන්,
(ඇ) නිල කාර්ය සඳහා උද්භිද උද්‍යානයට ඇතුලුවන රජයේ නිලධාරීන්,
(ඈ) ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිදහස් කරනු ලබන, වෙන යම් තැනැත්තකු.

1A - G 39571 — 31 (2023/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. 2019.08.02 වැනි දිනැති අංක 2134/50 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධනය කරන ලද උද්භිද උද්‍යානවලට ඇතුලත්වීමේ නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**උපලේඛනය**

(1) තැනැත්තන් (එක් පුද්ගලයකුට) :-

(අ) ශ්‍රී ලාංකිකයන් :

| | | |
|---|---|---|
| | | *රු. ශ.* |
| 1. | වැඩිහිටියන් සහ වයස අවුරුදු දොළහට (12) වැඩි ළමයින් | 200.00 |
| 2. | වයස අවුරුදු දොළහට (12) අඩු ළමයින් සහ පාසල් ළමයින් | 30.00 |
| 3. | වයස අවුරුදු හැටට (60) වැඩි වැඩිහිටියන් (ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම මත) | 50.00 |

(ආ) විදේශිකයන් :

| | | |
|---|---|---|
| 1. | වැඩිහිටියන් සහ වයස අවුරුදු දොළහට (12) වැඩි ළමයින් | 3,000.00 |
| 2. | වයස අවුරුදු දොළහට (12) අඩු ළමයින් | 1,500.00 |
| 3. | පාසල් ළමයින් සහ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් (උද්භිද උද්‍යානයේ භාරකරු සෑහීමකට පත්වන පරිදි අදාළ ලිපිලේඛන ඉදිරිපත් කිරීම මත) | 2,000.00 |

EOG 05 - 0209

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.